**මැදගම ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

**(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂ සඳහා ගෙවා තිබුණු රු. 37,305 ක හිඟ වැටුප් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙසට ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී නිවැරදි කරන බව දන්වමි. |

**(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 223,726,650 ක වත්කම් විෂයයන් 2 ක් සඳහා අයිතිය තහවුරු කිරීමේ ලියවිලි සහ තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි 74 ක ලියවිලි සහ තක්සේරු වාර්තා නොමැති අතර ඉඩම් 37 ක් පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත තොරතුරු ඉදිරිපත් කර ඇත. ඉතිරි වත්කම්වල අයිතිය |

| | | | |
|---|---|---|---|
| | | | තහවුරු කර ගැනීමට කටයුතු කරමින් සිටි අතර විශාල මුදලක් දැරීමට හැකියාවක් නොමැති බැවින් ඉදිරියේ දී පිළිගත් තක්සේරුවක් කිරීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමුකරමින් සිටින බව දන්වමි. |

**1.4** <u>අනුකූල නොවීම්</u>

<u>**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**</u>

| **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| 24(1) (අ) වගන්තිය | 2008 වර්ෂයේ සිට මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර නොතිබුණු අතර හඳුනාගෙන තිබුණු මාර්ග 116 ක් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රතිපාදන වෙන් කරගෙන ඉදිරීයේ දී මාර්ග ගැසට් පත්‍රයේ පළ කරන අතර ලේඛන යාවත්කාලීන කරන බව දන්වමි. |
| (ආ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | 2014, 2015 හා 2016 වර්ෂවලදී අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 44 කට අදාලව අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කර ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | 2015,2016 වර්ෂවල ගොඩනැගිලි සැලසුම් සඳහා අදාළ පුද්ගලයින් දැනුවත්කර, ඉන් පුද්ගලයින් 7 දෙනෙකු සහතික ලබාගෙන ඇති අතර අනෙක් ඉදිකිරීම් නිමකර නොමැති බැවින් අනුකූලතා සහතික නිකුත් කළ නොහැකිව ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,240,890 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,915,221 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,175,538 | 930,849 | 637,007 | 293,842 | 215,538 | 215,538 | 128,328 | 87,210 |
| (ii) | කුලී | 18,226,645 | 17,656,328 | 17,136,148 | 520,180 | 600,000 | 556,120 | 556,120 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 635,300 | 586,397 | 546,684 | 39,713 | 400,000 | 349,700 | 349,700 | - |
| (iv) | වෙනත් ආදායම් | 20,594,300 | 6,489,464 | 3,713,682 | 2,775,782 | 20,876,895 | 16,858,904 | 16,512,181 | 346,723 |
| | එකතුව | 40,631,783 | 25,663,038 | 22,033,521 | 3,629,517 | 22,092,433 | 17,980,262 | 17,546,329 | 433,933 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද රු. 215,538 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 42,437 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 20 ක් විය. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට අදාල විස්තර ආදායම් පරීක්ෂක වෙත ලබා දී ඇති බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 199,333 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 127,752 ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකළ මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් මුදලින් සියයට 64 ක් විය. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | ඉදිරියේ දී මේ සඳහා කඩිනම් පියවර ගැනීමට අපේක්ෂා කරන බව දන්වමි. |

**2.2.3** <u>කඩකාමර කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීර්ඝකාලීනව බදු දී තිබුණු කඩ කාමර 142 ක මාසික බදු කුලිය අය කිරීමේදී, ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව කටයුතු කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභා අරමුදලට රු. 11,059,708 ක ආදායමක් අහිමි වී තිබුණි. | නව තක්සේරු වටිනාකම් අනුව බදු කුලී අයකළ යුතුවේ. | කඩ හිමියන්ගේ විරෝධතා සැලකිල්ලට ගෙන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත නියමිත කුලියට අඩු කුලියක් අයකළ බව දන්වමි. |

**2.2.4** <u>ජල ගාස්තු ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ එකකට වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 7,424 ක සහ සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු. 97,525 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකරගත යුතුවේ. | 2020.05.31 දින වන විට රු. 26,442 ක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල අයකර ගන්නා බව දන්වමි. |

**2.2.5** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 259,152 ක් හා හිඟ මුද්දර ගාස්තු රු. 2,508,650 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කරන අතර, 2020 මැයි මස වන විට හිඟ මුද්දර ගාස්තුවලින් රු. 1,602,100 ක් අයකරගෙන ඇත. ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් රු. 64,470,000 ක් වූ ක්‍රියාකාරකම් 45 ක් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටු කළ යුතුවේ. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබීමත් හේතුවෙන් ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 දෙසැම්බර් 02 දින සිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කරමැටිය ප්‍රදේශයේ පිහිටි ඉඩමකට කසළ බැහැර කරමින් පැවති අතර දිරන කසළ භාවිතාකර කාබනික පොහොර නිපදවීම ආරම්භකර නොතිබුණි. | කාබනික පොහොර නිපදවීමට කටයුතු කළ යුතුවේ. | කාබනික පොහොර නිපදවීමට සුදුසු කසළ එකතුනොවීම සහ සේවකයන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කාබනික පොහොර නිපදවීමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී මේ සඳහා අවධානය යොමු කරන බව දන්වමි. |

**(ඇ)** තිරසර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.2** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 04කට අදාලව අතිරික්ත සේවකයන් 08 ක් හා තනතුරු 10 කට අදාලව සේවක පුරප්පාඩු 13 ක් පැවතුණි. | අතිරික්ත තනතුරු අනුමත කර ගතයුතු අතර පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | මාසික කාර්ය මණ්ඩල වාර්තාව මගින් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම්දී ඇති බව දන්වමි. |

**3.3** වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 58 ක මැනුම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඉඩම් 93 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම්වල මැනුම් කටයුතු කර නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවේ. | ඉඩම්වලින් කොටසක් සඳහා මැනුම් නියෝග ලබාගෙන ඇති අතර ඉතිරි ඉඩම්වල මැනුම් කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාවට අයත් පුස්තකාල 03 කින් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විටින් විට පාඨකයින්ට නිකුත්කර තිබුණු රු. 93,933 ක පිරිවැය වූ පුස්තකාල පොත් 459 ක් නැවත ලබාගෙන හෝ ඒ වෙනුවෙන් මුදල් අයකරගෙන හෝ නොතිබුණි. | නැවත ලබා ගැනීමට හෝ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පොත් 348 ක් බාරදී ඇති බව දන්වමි. |

(ඇ) වාහන උපයෝජනය

ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල නොකිරීම

| | | |
|---|---|---|
| සභාවට අයත් වාහන සහ යන්ත්‍රෝපකරණ 03 ක් 2019 ජනවාරි 01 සිට 2019 අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුලදී මීටර් පැය 1967.7 ක් ධාවනය කර, කර්මාන්ත 215 ක් ඉටුකළ බවට දෛනික ධාවන සටහන්වල දක්වා තිබුණු අතර ඒ සඳහා රු. 1,575,574 ක ඉන්ධන වියදමක් දරා තිබුණි. එහෙත් එම කර්මාන්තවලට අදාලව ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු හා නිමි වැඩ වාර්තා පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී නිමි වැඩ වාර්තා හා ඇස්තමේන්තු පිළියෙල කරන බව දන්වමි. |

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉටු නොකළ කර්තව්‍යයන් | | |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු. 12,150,000 ක් වූ කර්මාන්ත 75 ක් ඉටුකර නොතිබුණි. | අයවැය ලේඛනයේ සඳහන් කර්මාන්ත ඉටු කළ යුතුවේ. | අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇති අතර ඉදිරි වර්ෂයේ අභ්‍යන්තර විගණනයක් කරන බව දන්වමි. |

**4.2** <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | 2016 මාර්තු 24 දින කමිටුවක් පිහිටුවා ඇති අතර 2019 කාර්තු 3 ක රැස්වීම් පළාත් පාලන කොමසාරිස් කාර්යාලවල පැවැත්වූ බව දන්වමි. |